# දියකිඳුරියක් සොයා යන ගමන



ඩී.ඒ.එස්. දෙවන්සා

# දියකිදුරියක් සොයා යන ගමන

ඩී.ජී.එස්. දෙවන්සා

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකූර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි
2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වු අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදූහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි
මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර
විදූහල් පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 10 20

**ISBN 978 – 624 – 206 – 614 – 1**

කෘතිය පළ කරන දිනය **2023.11.15**

ඔන්න එකමත් එක කාලෙක බෙලා කියලා පුංචි බබෙක් හිටියා. එයා හරිම කැමතියි දිය කිදුරියන්ට. ඉතින් එයා හැම තිස්සෙම එයාගේ සෙල්ලම 'දියකිදුරියන් එක්ක සෙල්ලම් කරනවා.

එයා කනකොට, ඉස්කෝලෙ යනකොට, නිදා ගන්නකොට, ඒ හැම වෙලාවකම එයාගෙ සෙල්ලම් දියකිඳුරිය එක්කගෙන යනවා.

සමහර දවසට වීචගෙන් බැනුනුත් අහනවා. ඒත් ඉතින් දිය කිඳුරියන්ට තියන ආදරයටම එයා ඒක හංගගෙන හරි යනවා.


2 x 2 = ?
6 x 7 = ?
9 x 11 = ?
10 x 10 = ?
6 + 6 = ?
9 + 10 = ?
2 + 4 = ?
5 + 7 = ?
සෙල්ලම් බඩු ඉස්කෝලේ රැගෙන ඒම තහනම් !


ඉතින් එක දවසක් බෙලා නින්දට ගියා. ටික වෙලාවක් යනකොට එයාට දැනුනා එයා දියේ ගිලෙනවා කියලා. එයා ඇස් ඇරලා බලනකොට එයා මුහුදු පතුලේ කිමිදෙනවා. හරිම සීතලයි. ඒත් එයා ඒක ගනන් ගන්නේ නැතුව ටිකක් ඉස්සරහට පීනගෙන ගියා.

ඒ ගියෙත් දියකිදුරියක් අතරමගදි හම්බවෙයි කියලා. ඉතින් එයා ඉස්සරහට, ඉස්සරහට යනකොට එයාට ගල්ගුහාවක් හම්බ වුණා. එයාට හරිම කුතුහලයක් තමයි දැනුනේ ගල් ගුහාවට ගිහින් බලන්න. ඒත් එයාට චුට්ටක් බයත් හිතුනා. ඒ එයාට දියකිදුරියන් මතක් වෙන වාරයක් වාරයක් ගානේ එයාගෙ හිත කිව්වෙම ගල් ගුහාවෙන් එතෙර වෙන්න කියලා.



ඉතින් එයා බයෙන් බයෙන් ගල්ගුහාවෙන් එතෙර වුණා. එතකොටම එයා දැක්කේ ලස්සනම ලස්සන විශාල මාළිගාවක්. බෙලාට එයාගෙ ඇස් අදහගන්නත් බෑ. එයා කවදාවත් එහෙම දෙයක් දැකල තිබුණේ නැහැ. එයා හෙමින් හෙමින් මාළිගාවට ළං වුණා. එතකොටම කවුදෝ හිනැහෙන සද්දයක් එයා ලගින්ම ඇහුණා.

එයා වට පිට බලනකොට එයා දැක්කේ දියකිඳුරියන් ගොඩක් මාළිගාවේ සෙල්ලම් කරන හැටියි. බෙලාට හොඳම සතුටු හිතුණා. එයාට එයාගෙම ඇස් අදහගන්න බැහැ. එයා ඇස් ලොකු කරන් බලාගෙන හිටියා.


HA HA
This so
fun

ඉතින් ඔහොම චුට්ටක් වෙලා ඉන්නකොට එක දියකිදුරියක් බෙලාව දැක්කා. ඊට පස්සේ ඒ දියකිඳුරිය අනිත් දියකිඳුරියන්ට නොකියා බෙලා ළඟට ආවා. බෙලා සතුට වැඩිකමට දියකිඳුරියව බදාගත්තා. ඊට පස්සේ "පැටියෝ, ඔයාගේ නම මොකක්ද?" දියකිඳුරිය ඇහුවා. ඉතින් බෙලා එයාගේ නම කියලා මෙහෙම කිවුවා. "අනේ දියකිඳුරිය, ඔයා එනවද මගේ ගෙදර යන්න?

මම කැමතියි දියකිඳුරියන්ට, අනේ එන්නකෝ අපේ ගෙදර යන්න" ඊට පස්සේ දියකිඳූරිය කිව්වා "අනේ පැටියෝ, එතකොට මගේ ගෙදර අය? "අයියෝ, ඒ කියන්නේ ඔයාට මාත් එක්ක එන්න බැරිද?"බෙලා කිවුවා. "අනේ පැටියෝ මට මගේ ගෙදර අය දාලා එන්න බෑනේ" "හරි එහෙනම් අපි මෙහෙම කරමු.

මම හැමදාම මේ වගේ ඔයාව බලන්න එන්නම්" බෙලා කිව්වා. "හා පැටියෝ, ඒක හොඳ අදහසක්, අපි එහෙම කරමු. දැන් ඔයා ගෙදර යන්න. හෙට ආයෙත් එන්න" දියකිඳුරිය කිවුවා. ඊට පස්සේ බෙලා ආයෙත් යන්න ගියා.


දුව නැගිටින්න
මං කොහොද මේ ඉන්නේ

ටික වෙලාවකින් “චූටි දූ, නැගිටින්න, ඉස්කෝලෙ යන්න තියෙනවා” අම්මා කෑ ගැසුවා. බෙලා නැගිටලා වටපිට බැලුවා. එයාට තේරුණා එයා දැක්කේ හීනයක් කියලා. ඒක දැනගත්ත ගමන් බෙලාට ගොඩක් දුක හිතුණා. එයා දුකෙන් ඇඳෙන් බැහැලා ඉස්කෝලේ යන්න ලෑස්ති වුණා.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023 10 20